# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2023 අගෝස්තු

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ 2013=100 වූ දර්ශක යොමු කාලය 2023 ජනවාරි මාසයේ සිට 2021=100 වන නව දර්ශක යොමු කාලයට යාවත්කාලීන කර ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2023 අගෝස්තු මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 2.1%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2023 ජූලි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 4.6%ක් ලෙස වාර්තා විය. 2023 අගෝස්තු මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -2.6%ක හා ආහාර නොවන කාණ්ඩයේ 4.7%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2023 ජූලි මාසයේදී -2.5% සිට 2023 අගෝස්තු මාසයේදී -5.4% දක්වා අඩු වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2023 ජූලි මාසයේදී 10.9% සිට 2023 අගෝස්තු මාසයේදී 9.0% දක්වා අඩුවිය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2023 ජූලි මාසයේ 201.9ක් වූ දර්ශකාංකය 2023 අගෝස්තු මාසයේ දී ද 201.9ක් ලෙස නොවෙනස්ව පැවති බව වාර්තා විය. වියදම් අගය මත පදනම්ව, මාසික වෙනස්වීම සඳහා ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.56% කින් අඩුවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.60% කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට එළවළු, අළුත් මාළු, බිත්තර, අමුමිරිස්, පොල්, කුකුළු මස්, පොල්තෙල්, රතුළූණු, පාන්(සාමාන්‍ය), බිස්කට්, මිරිස් කුඩු, බනිස්, නූඩ්ල්ස්, මුංඇට, සහල්පිටි, කරවල සහ තිරිඟුපිටි යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි අඩුවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. එහෙත් අළුත් පළතුරු, දෙහි, සීනි, ලොකුළූණු, සහල්, මයිසූර් පරිප්පු, කවුපි, ඉඟුරු සහ පපඩම් යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2023 අගෝස්තු මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (*ජල බිල්පත*), 'ප්‍රවාහන' (*පෙට්‍රල්*), 'විවිධ භාණ්ඩ හා සේවා' (*මෝටර්රථ රක්ෂණය*), 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (*පුවක්*) සහ 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත් 'රෙදිපිළි හා පාවහන්', 'විනෝදාත්මක හා සංස්කෘතික' (*පොත්*), 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත. තව දුරටත් සළකා බැලීමේදී 'සෞඛ්‍ය' කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. එසේම 'අධ්‍යාපන' හා 'සන්නිවේදන' යන කාණ්ඩ වලට අයත් අයිතමයන්ගේ මිල අගෝස්තු මාසය පුරා නොවෙනස්ව පැවති බවත් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පාද වර්ෂය: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්ඡාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2023 ජූලි මාසයේ 6.3% සිට 2023 අගෝස්තු මාසයේදී 4.1% දක්වා අඩුවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2022** | අගෝ. | 197.7 | 237.5 | 171.9 | 181.2 | 2.4 | 2.5 | | | | |
| | සැප්. | 201.9 | 239.1 | 178.0 | 185.9 | 2.1 | 2.6 | | | | |
| | ඔක්. | 201.6 | 236.5 | 179.1 | 188.0 | -0.1 | 1.1 | | | | |
| | නොවැ. | 200.3 | 233.2 | 179.1 | 187.8 | -0.6 | -0.1 | | | | |
| | දෙසැ. | 200.4 | 232.4 | 179.8 | 188.0 | 0.0 | 0.1 | | | | |
| **2023** | ජන. | 201.8 | 232.8 | 181.8 | 189.8 | 0.7 | 1.0 | 53.2 | 53.6 | 52.9 | 52.0 |
| | පෙබ. | 204.1 | 228.1 | 188.6 | 189.4 | 1.1 | -0.2 | 53.6 | 49.0 | 57.4 | 50.1 |
| | මාර්තු | 204.8 | 223.2 | 193.0 | 188.1 | 0.3 | -0.7 | 49.2 | 42.3 | 54.9 | 44.2 |
| | අප්‍රේල් | 202.7 | 223.8 | 189.1 | 188.2 | -1.0 | 0.1 | 33.6 | 27.1 | 39.0 | 31.8 |
| | මැයි | 203.1 | 226.1 | 188.3 | 187.8 | 0.2 | -0.2 | 22.1 | 15.8 | 27.6 | 21.6 |
| | ජූනි | 203.3 | 228.4 | 187.1 | 186.5 | 0.1 | -0.7 | 10.8 | 2.5 | 18.3 | 11.3 |
| | ජූලි | 201.9 | 227.5 | 185.3 | 188.0 | -0.7 | 0.8 | 4.6 | -2.5 | 10.9 | 6.3 |
| | අගෝ. | 201.9 | 224.6 | 187.3 | 188.7 | 0.0 | 0.4 | 2.1 | -5.4 | 9.0 | 4.1 |